# අභිමානයෙන් පෙරට ...... !

**37** වෙනි සංවත්සරය සමරන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වෙනුවෙන් ප්‍රකාශයට පත් කෙරෙන විශේෂ "ගොවි ජනතා" සඟරාවට සටහනක් තැබීමට ලැබීම සොම්නසට කරුණකි. සැබැවින්ම, එකී සොම්නස් සහගත සිතුවිල්ල මෙම ආයතනයේ කාර්ය මණ්ඩලය සමඟ සුහදව බෙද හද ගන්නට ලැබීම ද භාග්‍යයකි.

සමාජ-ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමී රාජ්‍ය ආයතනයක් 37 වසරක කාලය තුළ ඉටු කළ කාර්ය භාරය ලඝු කොට තැකිය නො හැකිය. මෙහි දී, මෙම ආයතනය පිහිටුවීමට පදනම් වූ අරමුණු කෙරෙහි ද අවධානය යොමු කිරීම වඩාත් කාලෝචිත යැයි සිතමි.

මෙයට තිස් හත් වසරකට පෙරාතුව අග්නිදිග ආසියාතික ප්‍රදේශයන් හි ගොවි කටයුතු පිළිබඳ පර්යේෂණ හා පුහුණුවීම් සඳහා ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාවය කැපී පෙණුනි. මේ සඳහා රටවල් ගණනාවක්, ජාත්‍යන්තර සහයෝගය මත එවන් ආයතනයක් තම රටවල් තුළ ස්ථාපනය කිරීම සඳහා ප්‍රයත්න දැරීය. එවකට කෘෂිකර්ම අමාත්‍යවරයාව සිටි දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිඳුන්ගේ නො පසුබට උත්සාහය හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ එම යෝජිත ආයතනය පිහිටුවීමට හැකි විය. එකී ආයතනයෙන් අපේක්ෂිත කාර්යයන් අතර ප්‍රධාන කාර්යයන් කිහිපයකි. එනම්,

1. අසල්වැසි රටවල් සම්බන්ධ කරගෙන ගොවිජන ව්‍යුහයට අදළ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.
2. ගොවිජන ප්‍රතිසංස්කරණ සහ අදළ විෂයයන් සම්බන්ධයෙන් පුහුණු පහසුකම් සැපයීම.
3. ගොවිජන ප්‍රශ්න හා ඊට සම්බන්ධ විස්තර එක් රැස් කරන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

කෙසේ වුවත්, මෙම ආයතනය ශ්‍රී ලංකාවේ පිහිටුවීමේ තීරණය 1969 වර්ෂයේදී ගනු ලැබිය. එම තීරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1972 පෙබරවාරි 21 දින ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංස්ථාගත කෙරුණි. එකී දිනය අපි සංවත්සර දිනය ලෙස සෑම වසරකම සමරනු ලබන්නෙමු. මෙවර සංවත්සරයේ දී, එකී සැමරුම වඩාත් අර්ථාන්විත වීමට හේතු කාරණා ගණනාවක් බලපා ඇති බැව් නිහතමානිව මෙහි සඳහන් කරනු කැමැත්තෙමි.

37 වෙනි සංවත්සරය යෙදෙන දෙදහස් නවය වසරේ අපි ප්‍රථම වරට ආයතනයේ සෑම තරාතිරමකම සේවක සහභාගිත්වය ඇතිව සකසන ලද සංගත සැලසුමකට අනුව කටයුතු කිරීම අරඹා ඇත්තෙමු. එයම කිසියම් සුවිශේෂී ජයග්‍රහණයකැයි මම සිතමි. සැලසුමකට අනුව කටයුතු කිරීම තුළින් බොහෝ ජයග්‍රහණයක් ලද හැකි බැව් මම විශ්වාස කරමි.

කෙසේ වෙතත්, මෙම තිස් හත් වෙනි සංවත්සරය වෙනුවෙන් වැඩසටහන් ගණනාවක් ම ක්‍රියාවට නඟා ඇත. එහි එක් පියවරක් වශයෙන් පාඨක ඔබ අතට පත් වෙන මෙම "ගොවි ජනතා" සඟරාවේ විශේෂ කලාපය හැඳින්විය හැකිය. එය සුපසන් සිතින් ඔබ සැමට තිළිණ කරමි.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පමණක් නොව විවිධ පර්යේෂණ ක්ෂේත්‍රයන්ගේ විවිධ වූ පැතිකඩයන් නියෝජනය කරන විද්වතුන්ගේ සම්භාවනාවට පත් ව ඇති ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ඉටු කරන මෙහෙය අති මහත් ය. එම කාර්යයන් වඩාත් කාර්යක්ෂමව සහ පුළුල් පරාසයක් තුළ ඉටු කිරීම සඳහා 2009 - 2013 කාල පරිච්ඡේදයට සංගත සැලසුමක් තුළ කටයුතු කිරීම ආරම්භ කොට ඇති බැව් නැවත සඳහන් කරන්නේ මහත් වූ අභිමානයකිනි.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පමණක් නොව ජාත්‍යන්තර ගොවිකටයුතු ක්ෂේත්‍රය හා සම්බන්ධ වී පසුගිය වසර ගණනාවක ඉටු කළ කාර්යභාරය කිහිප ගුණයකින් වැඩිවෙමින් තිබෙන බවත් ඊට අවැසි ආකාරයට ආයතනය සැකසෙමින් තිබෙන අයුරුත් බොහෝ දෙනෙකුගේ අවධානයට යොමු වූ කරුණකි. මේ සම්බන්ධයෙන්,

ගෙවී ගිය වසර කිහිපය තුළ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා- පැසිපික් කලාපීය මධ්‍යස්ථානය සමඟ මෙම ආයතනය එක්ව ඉටු කළ ක්‍රියාකාරකම් කදිම නිදසුන් ය. එම කාර්යයන් සාර්ථක කර ගැනීමට තුඩු දුන් ප්‍රමුඛ හේතුව වන්නේ මෙම ආයතනයේ කාර්ය මණ්ඩලයේ කැපවීම සහ දක්ෂතාවය බව සඳහන් කරනු කැමැත්තෙමි.

2009 වසරේ රටේ සංවර්ධනයට ප්‍රමුඛස්ථානය දීමටත්, කුරිරු යුද්ධය නිමවා ශාපලත් දේශය ගලවා ගැනීමට ත්‍රිවිධ හමුදව ප්‍රමුඛ රජයේ ව්‍යායාමයට උපදේශන ආයතනයක් ලෙස ස්වකීය යුතුකම් සහ වගකීම් නොපිරිහෙළා ඉටු කිරීමටත් කැපවන බව විශේෂයෙන් අවධාරණය කිරීමට කැමැත්තෙමි.

සැබැවින් ම, තිස් හත් වසරක් සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමී කාර්යභාරයක් ඉටු කළ "හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට ස්වකීය විෂය පථය අතික්‍රමණය කරමින්, ගොවිකටයුතු ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා මෙහෙයක් කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවා"යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි ....... !

**වී.කේ. නානායක්කාර**

*අධ්‍යක්ෂ*
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## දැක්ම (Vision)

**ගොවිජන සහ ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙද හැරීමේ ප්‍රමුඛයා වීම.**

## මෙහෙවර (Mission)

**පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම.**